# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි දෙවන පරීක්ෂණය (බාහිර) - 2021

2024 අගෝස්තු

මානවශාස්ත්‍ර පීඨය

## ප්‍රතිබිම්බ කලා

**ව්‍යවහාරික ඡායාරූප ශිල්පය හා වීඩියෝ ශිල්පය IMAT 28214**

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

ප්‍රශ්න සංඛ්‍යාව : 10 යි. කාලය : පැය 03 යි.

---

01. "ආලේඛ්‍ය ඡායාරූපකරණය (Portrait Photography) යනු මානව උඩුකය ඡායාරූපගත කිරීම පමණක් යැයි ඔබේ මිතුරෙකු පවසයි." ඉහත කියමන හා ඔබ එකඟවන්නේ දැයි විමසන්න.

02. "වර්තමානය වන විට ඡායාරූපකරණය දෛනික ජීවිතයේ ප්‍රබල කොටසක් බවට පත්ව ඇත." ඡායාරූපකරණයේ ව්‍යවහාරික පාර්ශ්වය කෙරෙහි අවධානය යොමු කොට ඉහත කියමන නිදසුන් සහිතව විස්තර කරන්න.

03. වෘත්තීය ඡායාරූප ශිල්පියා (Professional Photographer) හා ආධුනික ඡායාරූප ශිල්පියා (Amateur Photographer) යනු කවරෙක් දැයි වෙන් වෙන් ව හඳුන්වා, වෘත්තීය ඡායාරූප ශිල්පියෙකු සතුවිය යුතු ගුණාංග මොනවාදැයි පැහැදිලි කරන්න.

04. රටක සංචාරක ව්‍යාපාරය දියුණු කිරීම උදෙසා ඡායාරූපකරණය බලපාන ආකාරය පිළිබඳ අවධානය යොමු කරමින්, සුදුසු මාතෘකාවක් පදනම් කොට ඡායාරූප සඟරාවකට සුදුසු ලිපියක් සම්පාදනය කරන්න.

05. වනජීවී ඡායාරූපකරණය (Wildlife Photography) යනු කුමක්දැයි හඳුන්වා, අනෙකුත් ඡායාරූප ශානරවලින් වනජීවී ඡායාරූපකරණය වෙනස්වන්නේ කෙසේදැයි නිදර්ශන සහිතව විස්තර කරන්න.

06. නිර්මාණාත්මකව ඡායාරූපයක් සටහන් කර ගැනීමේ දී සංරචනය (Composition) වැදගත් වන ආකාරය නිදසුන් සහිතව විස්තර කරන්න.

07. අධිගතික පරාස ඡායාරූපකරණය (HDR Photography) යනු කුමක්දැයි හඳුන්වා අධිගතික පරාස ඡායාරූපයක් සකසා ගැනීමේ දී අනුගමනය කරනු ලබන ක්‍රියා පිළිවෙල විස්තර කරන්න.

08. මංගල ඡායාරූපකරණයේ දී (Wedding Photography) භාවිත වන නව ප්‍රවනතා හා තාක්ෂණික ක්‍රම මොනවාදැයි සාකච්ඡා කරන්න.

09. වෙළෙඳ පොළෙන් වීඩියෝ කැමරාවක් මිලදී ගැනීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු මොනවාදැයි විස්තර කරන්න.

10. වීඩියෝ මාධ්‍යයේ දී කැමරා කෝණ (Angles) හා රූප (Shot) භාවිත වන ආකාරය නිදර්ශන සහිතව පැහැදිලි කරන්න.

***************************